**බුද්ධශාසන අරමුදල - 2015**

**-----------------------------**

බුද්ධශාසන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව අස්තිත්වයක් විසින් පූර්ව කාල පරිච්ඡේදවලදී සිදු වී ඇති වැරදි සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහිම අතීතානුයෝගීව නිවැරදි කිරීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයට අදාලව කරන ලද වියදම් සහ ලැබීම් රු.684,716 ක් අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමට හා සමුච්චිත අරමුදලට පිලිවෙලින් රු.481,982 ක් හා රු.202,734 ක් ගලපා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

අරමුදල වෙත ලැබෙන විවිධ පරිත්‍යාග, ආදායමක් ලෙස හඳුනා ගැනීම හෝ ස්කන්ධයේ කොටසක් ලෙස සැලකීමේ දී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---

රාජ්‍ය වෙසක් උත්සවය සඳහා ආපසු ගෙවීමේ පදනම මත බුද්ධශාසන අමාත්‍යාංශයෙන් ලබාගත් රු.8,000,000 ක් බැරකම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට පරිත්‍යාග ලෙස දක්වා තිබුණි.

#### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---

ගිණුම්වල දැක්වුණු වටිනාකම රු. 12,896,050 ක් වූ බෞද්ධ ධර්ම ග්‍රන්ථ පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන හා සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 8 (ආ) වගන්තිය | ආයෝජනවලින් ලැබෙන ආදායම් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත කර ඇති ජංගම ගිණුමට බැර කළ යුතු වුවත්, රු.1,726,348 ක ආදායම් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.2 (ඇ) ඡේදය | බැංකු ගිණුම් සහ පොත්පත් නිතිපතා සසඳා කාර්තු වශයෙන් වාර්තා සකස්කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අරමුදලට ලැබී තිබූ මුළු පරිත්‍යාග මුදලින් සියයට 85 ක් එනම් රු.66,820,561 ක් පෞද්ගලික සමාගමකින් ලැබී තිබුණු අතර එම පරිත්‍යාග බුද්ධ ශාසන අරමුදල හරහා, විහාර සංවර්ධන සමිතියක් මඟින් සිදු කරන බුදු පිළිමයක් නෙලීමේ කටයුත්තක් සඳහා මුදාහැර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අරමුදල මැදිහත් වී නොතිබුණ අතර පරිත්‍යාග කරන ලද සමාගම විසින්ම කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කර තිබුණි. මේ අනුව පරිත්‍යාග මාරුකිරීම සඳහා පමණක් අරමුදල අතරමැදියකු ලෙස කටයුතු කර තිබූ අතර එය අරමුදලේ අරමුණු හා එකග නොවන බව නිරීක්ෂණය විය. තවද බුදු පිළිමය නෙලීමේ කටයුතු සඳහා වියදම් සනාථ කරන බිල්පත් අරමුදල වෙත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 වර්ෂයේ දී ලැබුණු පරිත්‍යාග නිදහස් කිරීම මගින් සියයට එකක කොමිස් ආදායම් ලෙස රු.137,000 ක් අරමුදල වෙත රැස්කර තිබුණද සම්පූර්ණ මුදලම පිළිගත් පුන්‍ය ආයතනයකට කළ පරිත්‍යාග ලෙස දැක්වීමෙන් රජයට අහිමිවිය හැකි බදු ආදායම පිළිබඳව සැලකිළිමත් වී නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,945,573 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,401,904 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,456,331 කින් පිරිහී තිබුණි. ආයෝජන ආදායම රු.4,005,330 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්ය සාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බුද්ධශාසන අරමුදලේ කාර්යභාරය වනුයේ බුද්ධශාසනය ආරක්ෂා කර ගැනීම සහ පෝෂණය කිරීම අරහයා ඉතාමත් යෝග්‍යයැයි පාලක මණ්ඩලය සලකන ආකාරයට සහ එසේ සලකනු ලබන කාර්යය සඳහා මුදල් යෙදවීමයි. ඒ අනුව බුද්ධශාසන අරමුදල පනතේ, 07 වන වගන්තිය ප්‍රකාරව චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීම, දැරීම සහ කළමනාකරණය කිරීම, අරමුදලට අයත් චංචල හෝ නිශ්චල යම් දෙයක් නියාදනය, බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා ආයතන පිහිටුවීම සහ බුද්ධශාසනය ආරක්ෂා කිරීමෙහි සහ පෝෂණය කිරීමෙහි නිරතව සිටින ආයතන කළමනාකරණයෙහිලා සහාය වීම, අරමුදලේ පරිපාලනයට අදාල සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදීම සඳහා අරමුදල වෙත බලතල පැවරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අරමුදල විසින් බුද්ධශාසනයේ උන්නතිය සඳහා සමස්ත වියදමින් සියයට 80 ක් හෙවත් රු.5,075,942 ක් පමණක් වැය කර තිබූ අතර අරමුදල සතු සමස්ත වත්කම් වලින් සියයට 91 ක් හෙවත් රු.483,124,345 ක් රාජ්‍ය බැංකු තුනක ආයෝජන වල යොදවා තිබුණි. මුදල් ආයෝජනයෙන් පොළී රැස්කර තිබුණද බුද්ධශාසන අරමුදල පනත මගින් ලබාදී තිබූ බලතල ප්‍රයෝජනයට ගනිමින් දේශීය හෝ විදේශීය වශයෙන් අරමුදලට මුදල් රැස් කර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර අරමුදලේ දැනට පවතින මුදල් බුද්ධශාසනයේ උන්නතිය වෙනුවෙන් වැය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදලේ පරිපාලන කටයුතු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය විසින් රු.2,357,957 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබූ අතර එයට අතිරේකව අරමුදල විසින් ද රු.780,510 ක් වැය කර තිබුණි. කෙසේ වුවද අරමුදල විසින් සම්ප්‍රදායික ක්‍රියාකාරකම් කොටසක් පමණක් අඛණ්ඩව ඉටු කර තිබූ නමුත් අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉටු කළ යුතු අනෙකුත් ක්‍රියාකාරකම් කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඈ) සුනාමි ආධාර සහ සිවුපස ආධාර හා විවිධ පරිත්‍යාග ලෙස පිලිවෙලින් ලැබී තිබුණු රු.1,348,796 ක් හා රු.1,448,096 ක් අදාල අරමුණු ගත කාර්යයන්වල යෙදවීමෙන් තොරව වර්ෂ 10 කට අධික කාලයක් ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබුණි.

(ඉ) වටිනාකම රු.317,400 ක් වූ බුද්ධ ජයන්ති කාසි තොගය විකිණීමෙන් තොරව සේප්පුවේ ගබඩා කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී අරමුදලේ පාලක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් අනුව පාලි අට්ඨකථා සිංහලට හා ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, මුද්‍රණය කිරීම සහ විකිණීම යන කටයුතු පෞද්ගලික මුද්‍රණාලයකට පවරා ඒ සඳහා අවස්ථා 5 දී එකතුව රු.8,569,440 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාලි අට්ඨකථා 12 ක් ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම සඳහා රු.1,080,165 ක අත්තිකාරම් ගෙවා තිබුණද, මුද්‍රණය කරන ලද පොත් අරමුදල වෙත ලබාගෙන ලැබිය යුතු අත්තිකාරම් ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2015 දෙසැම්බර් 31 දින දක්වා පාලි අට්ඨකථා සිංහල පොත් මුද්‍රණය කර විකිණීමෙන්, අරමුදලට ලැබිය යුතු රු.7,988,635 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම වර්ෂ 2 ක කාලයක සිට ගිණුම්වල පැවතෙන පාලි ටීකා සිංහල පරිවර්තනය සඳහා ගෙවිය යුතු රු.544,409 ක මුදල නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, අරමුදල විසින් වර්ෂ ගණනාවක් තුල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 03 ට අමතරව කිසිදු නව ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. අරමුදලේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) දිවයින පුරා වැඩ සිටින උපසපන් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් වෛද්‍ය හා ජීවිත රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීමට අමාත්‍යාංශයෙන් රු.5,000,000 ක් ලබා දී තිබුණද, එම මුදලින් ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම හැර ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා කිසිදු පියවරක් වර්ෂය අවසානය දක්වාම ගෙන නොතිබුණි.

(ii) දඹදිව වන්දනාවේ නොගිය වැඩිහිටි භික්ෂූන් වහන්සේලා සඳහා එම සිද්ධස්ථාන වන්දනා කර ගැනීමේ අවස්ථා සලසාදීම එක් අරමුණක් වුවද එම වැඩසටහන ආරම්භ කර නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

ප්‍රමාණවත් සහ සුදුසු නිළධාරීන් අන්තර්ග්‍රහණය කළ හැකි පරිදි සේවක මණ්ඩලයක් අනුමත කරවා නොගැනීම හේතුවෙන් ආයතනයේ වැඩ බෙදීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වී නොතිබුණු අතර විශ්‍රාමික නිළධාරීන් බඳවා ගැනීමේදී විධිමත් අනුමැතියක් ලබා නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | අරමුදල් උපයෝජනය සම්බන්ධ පාලනය | අරමුදල සතු මූල්‍ය සම්පත් බාහිර ආයතනවල ආයෝජනය කර ආදායම් ඉපැයීමට වඩා බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා අවධානය යොමුකර නොතිබුණි. |
| (ආ) | ගිණුම්කරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය | ගිණුම් කටයුතු සම්බන්ධව අභ්‍යන්තර පාලනය හා සුපරීක්ෂණයක් සිදුවන පරිදි වැඩ බෙදීමක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ග්‍රන්ථ ප්‍රකාශනය ප්‍රවර්ධනය සම්බන්ධ පාලනය | අරමුදල සතු පොත් සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණය සිදු කිරීම, නිවැරදි හා සම්පූර්ණ වාර්තා පවත්වා ගැනීම, තොග පොත් යාවත්කාලීන කිරීම ප්‍රකාශන මුද්‍රණය හා අලෙවිය හා ගබඩා කිරීම විධිමත් පරිදි සිදුකර නොතිබුණි. |